www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 9 – Second Term Test – July 2019

දෙවන වාර පරීක්ෂණය - 2019 ජුලි - 9 ශ්‍රේණිය

කාලය : පැය 2
Time : 2 hours

## Drama and Theater - I

| 50 | S | I |
|---|---|---|

නාට්‍ය හා රංග කලාව – I

Name :- ...................................................... Grade : -................ Index number:-....................

- ❖ සැලකිය යුතුය,
- ❖ මෙම ලිඛිත ප්‍රශ්න පත්‍රය I සහ II වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. I පත්‍රය සඳහා ලකුණු 20 ක් ද II පත්‍රය සඳහා ලකුණු 40 ක් ද වශයෙන් මුළු ලකුණු සංඛ්‍යාව 60 කි.
- ❖ ප්‍රායෝගික ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 කි.
- ❖ අවසාන ලකුණු ගණනය කිරීමේ දී ලිඛිත හා ප්‍රායෝගික ප්‍රශ්න පත්‍රවල එකතුව 100% ගණනය කර ලබාදිය යුතුය.

❖ අංක 01 - 09 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. නාට්‍ය ඉදිරිපත් කර ඇති ආකාරය හඳුන්වන්නේ,
   (i) නාට්‍ය ශෛලිය (ii) නාට්‍ය රංගනය
   (iii) නාට්‍ය රචනය (iv) නාට්‍ය පසුතලය
2. ස්වතන්ත්‍ර නාට්‍යයකි.
   (i) ඛහින කලාව (ii) මූදු පුත්තු
   (iii) හිරු නැති ලොව (iv) කපුවා කපෝති
3. "සාත්වික අභිනය" යනු
   (i) සංවාදයකි (ii) මුහුණේ හැඟීම් පල කිරීමයි
   (iii) අංග චලනයයි (iv) ඉරියව් පෑමයි
4. "කදා වළලු"නාට්‍යයේ කච්ඡපුටගේ චරිතය අයත් වන්නේ,
   (i) යහපත් වෙළෙන්දාගේ චරිතයට (ii) අයහපත් වෙළෙන්දාගේ චරිතයට
   (iii) මිත්තණියගේ චරිතයට (iv) තොටියාගේ චරිතයට
5. ආනුෂංගික කලා අංග ලෙස හඳුන්වන්නේ,
   (i) නාට්‍යයට පිටතින් එකතු වන කලා අංග
   (ii) නාට්‍ය සංගීතය පමණකි
   (iii) නාට්‍ය අංග රචනය පමණකි
   (iv) නාට්‍ය පිටපත පමණකි



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

6. චරිතයක දැකිය හැකි විවිධ පැතිකඩ හැඳින්වීම සඳහා යොදා ගන්නා නමකි,

(i) භූමිකාව (ii) අභිරූපණය

(iii) චරිත නිරූපණය (iv) ආනුෂංගික අංග

7. නළුවෙකු සිය පෞද්ගලිකත්වය අතහැර චරිතයක් තුළ කිසියම් කාලයක් ජීවත්වීම හඳුන්වන්නේ,

(i) සමාරෝපයයි (ii) අනුරූපණයයි

(iii) අනුකරණයයි (iv) අභිරූපණයයි

8. සාත්වික අභිනය වඩාත් ප්‍රගුණ කිරීම සඳහා භාවිත කළ හැකි රංග අභ්‍යාසයකි,

(i) දර්පණ අභ්‍යාසය (ii) ස්වසන අභ්‍යාසය

(iii) සංවේදන අභ්‍යාසය (iv) කඩහඬ අභ්‍යාසය

9. ලෝක ස්වභාවයට අනුගත නොවන යම් නාට්‍ය ශෛලියක් වී ද එය,

(i) ලෝක ධර්මීය (ii) නාට්‍ය ධර්මීය

(iii) ස්වාභාවිකය (iv) මිශ්‍රය

❖ අංක 10 සිට 14 දක්වා ප්‍රශ්න සඳහා හරි නම් (✓) ලකුණ ද වැරදි (✗) නම් වැරදි ලකුණ ද යොදන්න.

10. "වේල්ල වැහුම්" එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍යයකි ( )

11. පසුතල නිර්මාණය ආංගික අභිනයට අයත් වේ ( )

12. "ආලවක දමනය" නාට්‍යමය ලක්ෂණ සහිත බෞද්ධ ප්‍රජාකර්මයකි ( )

13. හුණුවටයේ නාට්‍ය හෙන්රි ජයසේනයන්ගේ නාට්‍යයකි ( )

14. "මනමේ" නාට්‍ය සඳහා පුරාවෘත්ත කතාවක් පාදක කර ගැණිනි ( )

අංක 15 සිට 20 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

15. ................................................... නාට්‍යය සේරිවාණිජ ජාතකය ඇසුරෙන් නිර්මාණය වූ නාට්‍යයකි.

16. දයානන්ද ගුණවර්ධනයන් නිර්මාණය කළ ........................................ නාට්‍ය වාර්තා රංගයකි.

17. "පයින් ඇවිදිල්ල - මහන්සිද මන්ද" මෙම සංවාද කොටස අයත් වන්නේ ........................................ නාට්‍යයටයි.

18. ස්පාඤ්ඤ ජාතික ෆෙඩ්රිකෝ ගාර්ෂියා ලෝර්කාගේ යෙර්මා නාට්‍යයේ අනුවර්තනයකි .............................. නාට්‍යය.

19. බෞද්ධ අධ්‍යාපන පුනරුදය සඳහා ගෙන ගිය ඓතිහාසික අරගලය හා කැපකිරීම ................................................... නාට්‍යයෙන් විද්‍යාමාන වේ.

20. "මළ ගිය ඇත්තන් වෙනුවෙන් - පිනට මොකුත් මට ලැබෙන්න" සංවාද කොටස ..................................................................... නාට්‍යයේ ය.

(එලොව ගිහින් මෙලොව ආවා, නරි බෑණා, මූදු පුත්තු, ආනන්ද ජවනික, මධුර ජවනිකා, කදාවළලු)

*(ලකුණු 2 ×20 යි.)*





agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 9 – Second Term Test – July 2019

දෙවන වාර පරීක්ෂණය - 2019 ජුලි - 9 ශ්‍රේණිය

කාලය : පැය 2
Time : 2 hours

## Drama and theater - II

| 50 | S | II |
|---|---|---|

නාට්‍ය හා රංග කලාව – II

Name :- ................................................... Grade : -................ Index number:-....................

❖ **ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

1. හික්ෂුව :- විචිත්‍ර වර්ණෝපශෝභිත වූ මෙම මණ්ඩප ද්වාරයෙහි මිනිස්සු ඇත.
2. මිලිඳු රජු :- ස්වාමීනි, නුඹ වහන්සේ කවර නම් වී ද?
3. ගදහයා :- මේ අවේලාවේ ඔබ වහන්සේ මේ විමානයට වැඩියේ ඇයි?

1. (i) ඉහත (1, 2, 3) සංවාද අයත් වන බෞද්ධ පූජාකර්ම තුන පිළිවෙලින් නම් කරන්න. *(ලකුණු 06 යි.)*

   (ii) ඉන් එක් පූජාකර්මයක් සිදු කළ ආකාරය විස්තර කරන්න. *(ලකුණු 04 යි.)*

2. (i) සතර අභිනය නම් කර හඳුන්වන්න. *(ලකුණු 04 යි.)*

   (ii) මහළු හිඟන්නාගේ චරිතය නිරූපණය කිරීමේ දී ඔබ අනුගමනය කරන ක්‍රියාදාමය විස්තර කරන්න. *(ලකුණු 06 යි.)*

3. (i) නාට්‍යක් සඳහා භාවිත වන ආනුෂංගික අංග හතරක් නම් කරන්න. *(ලකුණු 04 යි.)*

   (ii) ඉන් එක් ආනුෂංගික අංගයක් නාට්‍ය නිර්මාණයක් සඳහා දායක කර ගන්නා ආකාරය විස්තර කරන්න. *(ලකුණු 06 යි.)*

4. (i) ප්‍රධාන නාට්‍ය ශෛලීන් දෙක නම් කරන්න. *(ලකුණු 04 යි.)*

   (ii) ඉන් එක් නාට්‍ය ශෛලියක් පහදා එහි ලක්ෂණ හතරක් ලියන්න. *(ලකුණු 06 යි.)*

5. පහත දැක්වෙන කතා සැකිල්ල ඔබට කැමති පරිදි අවසානයක් කරා ගෙන යමින් නාට්‍ය පෙළක් (රඟ දැක්වෙන කාලය විනාඩි පහක් ප්‍රමාණවත්ය) රචනා කරන්න.

   සේපාලිකා ශිෂ්‍යයත්ව විභාගය සඳහා පෙනී සිටිමට නියමිත දිනයට පෙර දින රාත්‍රීයේ ඇයගේ මව අසාධ්‍ය ලෙස රෝගී වූවාය. මව ලෙඩ ඇඳේ සිටම තමාගේ අසනීප තත්වය පිළිබඳ නොසිතා හෙට දින විභාගය සඳහා සතුටින් යන ලෙස සේපාලිකාගෙන් ඉල්ලා සිටියාය......

   නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය (ලකුණු 04 යි.)
   සංවාද හා රංග විධාන සහිත පෙළ රචනයට (ලකුණු 06 යි.)





Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk